**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 325 - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 77.04 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 70.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.74 ක් හෙවත් සියයට 8.75 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 39.27 | 37.81 | 1.46 | 3.72 |
| මූලධන | 37.77 | 32.49 | 5.28 | 13.98 |
| **එකතුව** | **77.04** | **70.30** | **6.74** | **8.75** |

## 2.2 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 6000/0000/00/0016/0118/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.62 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පරිගණක, මෘදුකාංග හා උපාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 91 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 3.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එහි ඇතුළත් කාර්යයන් 10 ක් අතරින් එක් කාර්යයක් පමණක් 2016 වර්ෂයේදී ආරම්භ කර වැඩ අවසන් කර තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වැඩ සඳහා අනුමත අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 37.76ක් වූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රාග්ධන වැඩවල වටිනාකම රු.මිලියන 1,973.70 ක් විය. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පදනම් කරගෙන පිළියල කර නොතිබුණි.

### 3.3.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.

### 3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව දෙපාර්තමේන්තුව විසින් 2017 ජුනි 16 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

2015 වර්ෂයේදී ගර්හිත තත්ත්වයේ පවතින බවට තීරණය කළ රූපවාහිනී යන්ත්‍ර 03 ක්, සංඥා යන්ත්‍රයක්, විදුලි පංකා 08 ක් ඇතුළුව යන්ත්‍ර උපකරණ 15 ක් අපහරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමෙන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් 69 ක් හා නැවියන් 1,118 ක් ද්විතීක පදනම මත අනුයුක්ත කර තිබුණි.